SINHALESE

Court Network



# අධිකරණයේ ඔබේ දිනය

## A Guide


Magistrates' Court

# මහේස්ත්‍රාත් අධිකරණයේදී අධිකරණ සිදුවීම් වර්ග

**අපරාධ:** ඔබ නීතිය කඩකර ඇතිබව පොලීසිය විසින් පවසන සිදුවීම. උදාහරණයක් ලෙස, මාර්ග නීති කඩකිරීම්, හොරකම් හෝ පහරදීම්.

**සිවිල්:** පාර්ශ්ව දෙකක් අතර ඇති වන ආරවුල්. උදාහරණයක් ලෙස, ණය, ගිවිසුමක් කඩ කිරීම, දඩ නොගෙවීම්.

**මැදිහත්වීම් නියෝග:** යමෙකු ප්‍රචණ්ඩකාරී ලෙස ක්‍රියා කර ඇති හෝ වෙනත් පුද්ගලයෙකුට හානියක් කර ඇති සිදුවීමක් උදා. පවුලේ සාමාජිකයෙකු, අසල්වැසියෙකු, ආගන්තුකයෙකු සහ පොලිසිය හෝ බලපෑමට ලක් වූ පුද්ගලයා ආරක්ෂාව සඳහා මැදිහත්වීමේ නියෝගයක් අපේක්ෂා කිරීමක්.



# අධිකරණයට සූදානම් වීම

## අධිකරණයට පැමිණීම

- අධිකරණ සෑමවිටම පොදු ප්‍රවාහන මාර්ග ආසන්නයේ නොමැති අතර වාහන නැවැත්වීම සෑමවිටම නොමිලේ හෝ ලබාගැනීමට නොහැකි විය හැකිය. ඔබේ අධිකරණ දිනයට පෙර ඔබ උසාවියට පැමිණීම හා පිටවීම සලකා බලන්න.
- අධිකරණ ගොඩනැගිල්ලට ඇතුළු වීමට ඔබ ආරක්ෂක අංශය හරහා යා යුතුවේ. අධිකරණයට කිසිම ආයුධයක් හෝ තියුණු භාණ්ඩයක් රැගෙන ඒමෙන් වලකින්න.

## ඔබට භාෂා පරිවර්තකයෙකු අවශ්‍ය නම්

- ඔබට අධිකරණයේදී සහය වීමට භාෂා පරිවර්තකයෙකු අවශ්‍ය නම්, අධිකරණ දිනයට පෙර අධිකරණයට කතා කරන්න, ඔබ නොමිලේ භාෂා පරිවර්තන සේවාව ලබාගැනීමට සුදුස්සෙකු විය හැක.
- ඔබට භාෂා පරිවර්තකයෙකු අවශ්‍ය නම්, ඔබ භාෂා පරිවර්තකයෙකු භාවිතා කිරීම වැදගත් ය. ඔබ අධිකරණයේ සිදුවන දේ තේරුම්ගැනීම වැදගත් ය.
- ඔබ පරිවර්තකයෙකු වෙන්කර ඇත්නම්, ඔබේ නඩු විමසීම භාෂා පරිවර්තකයා නොමැතිව සිදු නොවනු ඇත. භාෂා පරිවර්තකයෙකු වෙන්කරවා ගෙන ඇත්දැයි ඔබ නිශ්චිතවම දන්නේ නැත්නම් රෙජිස්ට්‍රි මේසයෙන් පරීක්ෂා කරන්න.

## අධිකරණයේ කටයුතුවලට මුළු දවසම ගතවීමට හැකිය

- ඔබ අධිකරණයේ පැය කිහිපයක් හෝ සම්පූර්ණ දවසම ගත කිරීමට ඉඩ ඇති හෙයින් ඔබේ අධිකරණ දිනයේ වෙනත් කටයුතු සඳහා වෙන්කරගැනීමෙන් වලකින්න. ඔබ රැකබලාගන්නා ළමයින් හෝ පුද්ගලයින් සිටීනම්, එදින සඳහා ඔවුන්ව රැකබලාගැනීමට වෙනත් අයෙක් යෙදවීමට හෝ අධිකරණයට දැනුම්දීමට කටයුතු කරන්න.

## නීති උපදෙස්


- ඔබ අධිකරණයට පැමිණීමට පෙර නීති උපදෙස් ලබාගන්නා ලෙස අධිකරණය නිර්දේශ කරයි. ඔබ නීතිඥයෙකු සමඟ කතා කර නොමැති නම්, ඔබ රාජකාරි නීතිඥ සේවය සඳහා සුදුසුකම් ලබන්නේද යන්න රෙජිස්ට්‍රියෙන් විමසිය හැක.

# සහය

- හැකිනම්, අධිකරණයට පැමිණීමේදී සහය පුද්ගලයෙකු සමඟ පැමිණෙන්න. මෙම පුද්ගලයා මිතුරෙකු හෝ පවුලේ සාමාජිකයෙකු විය හැකිය. ඔබට එය සිදුකළ නොහැකිනම් හෝ අධිකරණය හා එහි කටයුතු සම්බන්ධ කටයුතු පිළිඹඳ අවබෝධයක් ඇති අයෙකුගෙන් අමතර සහය ලබාගැනීමට අවශ්‍ය නම්, ඔබට 1800 571 239 ඔස්සේ **අධිකරණ ජාලය** (Court Network) හරහා සහය වෙන්කරගත හැකිය.

# ඇඳිය යුත්තේ කුමක්ද සහ රැගෙන ආ යුත්තේ මොනවාද

- අඳින්න: ස්මාර්ට්, පිරිසිදු ඇඳුම්
- රැගෙන එන්න: කෙටි ආහාර සහ වතුර, ඔබේ නඩුවට/ කටයුත්තට අදාල ලේඛණ තිබේනම් ඒවා සහ සම්පූර්ණයෙන් ආරෝපිත උපාංග.
- නොකරන්න: තොප්පියක් පැළඳීම හෝ යකඩ හෝ වීදුරු අධිකරණයට රැගෙන ඒම.



# අධිකරණය

## ඔබ පැමිණි පසු

- ඔබ උසාවියට පැමිණි පසු රෙජිස්ට්‍රි කවුන්ටරය වෙත යන්න.
- ඔබට උසාවි නඩු විභාගයක් ඇති බව රෙජිස්ට්‍රි කාර්ය මණ්ඩලයට කියන්න, ඔබේ අධිකරණ ලේඛන ඔවුන්ට පෙන්වන්න.
- උසාවිය ඔබට භාෂා පරිවර්තකයෙකු වෙන් කර ඇත්නම්, ඔවුන් පැමිණෙන කාලය කාර්ය මණ්ඩලයෙන් විමසන්න. භාෂා පරිවර්තකයෙකු වෙන් කර නොමැති නමුත් ඔබට එවැන්නෙක් අවශ්‍ය නම්, භාෂා පරිවර්තකයෙකු සිටීදැයි කාර්ය මණ්ඩලයෙන් විමසන්න.
- ඔබට නීතීඥයෙකු සිටීද නැතහොත් ඔබම ඔබ වෙනුවෙන් පෙනී සිටින්නේද යන්න රෙජිස්ට්‍රි කාර්ය මණ්ඩලය අසනු ඇත. ඔබට නීතීඥයෙකු නොමැති නම්, ඔබ අධිකරණයේ රාජකාරි නීතිඥවරයෙකු සිටීදැයි සොයා බැලිය යුතුය.
- රෙජිස්ට්‍රිය විසින් ඔබේ නඩුව විභාග කරන්නේ කුමන උසාවි කාමරයේදැයි පැවසිය හැක.
- ඔබට ආරක්ෂිත ගැටලු ඇත්නම්, රෙජිස්ට්‍රියට හෝ ආරක්ෂක අංශයට දැනුම්දෙන්න.

## ඔබේ නඩු අවස්ථාවට රැඳී සිටීම

- ඔබේ නඩුව විභාග වේලාව වන තෙක් ඔබ බලා සිටින අතරතුර ඔබට බලා සිටීමට රැඳීසිටීමේ ස්ථානයක් ඇත. ඔබට පැය කිහිපයක් සිටීමට සිදු විය හැකි හෙයින් ඉවසීමෙන් රැඳීසිටින්න.
- ඔබට කිසියම් හේතුවකට අධිකරණයෙන් පිටවීමට අවශ්‍ය නම්, ඔබේ විභාගය මඟ නොහැරෙන බව තහවුරු කිරීමට කරුණාකර රෙජිස්ට්‍රියට දන්වන්න.
- භාෂා පරිවර්තකයෙකු වෙන්කර ඇත්නම්, පරිවර්තකයා පැමිණෙනතුරු ඔබේ විභාගය සිදුනොවනු ඇත.
- ඔබේ නඩුව විභාග කිරීමට සූදානම් වූ විට, ඔබව අධිකරණයට කැඳවනු ඇත.




# අධිකරණ කාමරය

- ඔබේ නඩුව කැඳවූ විට, අධිකරණ කාමරයට යන්න.
- ඔබේ දුරකථනය නාද නොවන ලෙස සකසන්න.
- ඇතුල්වීමේදී සහ පිටවීමේදී මහේස්ත්‍රාත්වරයාට හිස නමන්න.
- ඔබේ නඩුවේ සිදුවන්නේ කුමක්ද යන්න පිළිබඳව මහේස්ත්‍රාත්වරයා ඔබෙන් ප්‍රශ්න කිහිපයක් අසනු ඇත. ඔබට නීතිඥයෙකු සිටී නම් ඔවුන්ට ඔබ වෙනුවෙන් කතා කිරීමට ඉඩ දෙන්න, ඔබට නීතිඥයෙකු නොමැති නම්, ඔබට මහේස්ත්‍රාත්වරයා සමඟ කතා කළ හැකිය. "යුවර් හොනර් (Your Honour)" ලෙස මහේස්ත්‍රාත්වරයා අමතන්න.
- ඔවුන් නඩුවේ තොරතුරු දැනගත් පසු, සිදුකළයුතු දේ පිළිබඳව මහේස්ත්‍රාත්වරයා තීරණය කරනු ඇත. ඔබට නැවත අධිකරණයට පැමිණීමට සිදුවිය හැකිය, නැතහොත් එම දිනය තුළදීම නඩුව අවසන්විය හැකිය.
- සිදුවන්නේ කුමක්ද යන්න පැහැදිලි නැතිනම් ඔබට මහේස්ත්‍රාත්වරයාගෙන් ප්‍රශ්න ඇසීම සිදුකළ හැකිය.

# අධිකරණයෙන් පසුව

- මහේස්ත්‍රාත්වරයා ඔබේ නඩුව අවසන් කිරීමෙන් පසු ලේඛන එකතු කිරීමට හෝ අත්සන් කිරීමට ඔබෙන් ඉල්ලා සිටිය හැක.
- රෙජිස්ට්‍රි මේසය වෙත ගොස් ඔබට උසාවියෙන් පිටවීමට පෙර කළ යුතු යමක් තිබේදැයි බලන්න.
- ඔබට උසාවියෙන් පසු ප්‍රශ්න ඇත්නම් හෝ ඔබ නැවත උසාවියට පැමිණෙන්නේ නම් සහ සහය අවශ්‍ය නම්, ඔබට 1800 571 239 ඔස්සේ **අධිකරණ ජාලය** (Court Network) ඇමතීමට හැකිය.


මහේස්ත්‍රාත්වරයා
අධිකරණය ලිපිකරු
විත්තිකරු/ නීතිඥයා
සාක්ෂිකරු කුටිය
නඩු පවරන්නා/ පොලීසිය
මහජන ප්‍රදේශය

Victorian Legal Services
**BOARD + COMMISSIONER**
Funded through the Legal Services Board Grants Program


අධිකරණ ජාලය (Court Network)
1800 571 239
www.courtnetwork.com.au
admin@courtnetwork.com.au
Lvl 5, 555 Lonsdale Street,
Melbourne, Vic, 3000


මෙය අධිකරණයේ ඔබේ දිනය සඳහා දළ මාර්ගෝපදේශයකි. අධිකරණ ක්‍රියාවලීන් වෙනස් වන විට තොරතුරු වෙනස් වීමට ඉඩ ඇත.

වෙනත් භාෂා ඇතුළුව අන්තර්ජාලය හරහා සම්පත් වෙත ප්‍රවේශය සඳහා

උසාවි ජාලය වෙත යොමු කිරීමක් කිරීමට